# මීගමුව අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම - 2016

**නර්තනය** **6 ශ්‍රේණිය**

විභාග අංකය :........................................................ **කාලය පැය 02 යි**

## I කොටස

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
★ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ගැමි නැටුම්වල සුවිශේෂී ලක්ෂණයක් වනුයේ,
(1) ගොඩ සරඹ නැටීම ය. (2) කාන්තාවන් පමණක් නැටීම ය.
(3) කවි ගායනය කිරීම ය. (4) රංග භාණ්ඩයක් අතැතිව නැටීම ය.

02. "තෙයි කිත තෙයි තාම්" මෙය,
(1) දෙවන ගොඩ සරඹ පදය වේ. (2) පළමු පා සරඹ පදය වේ.
(3) දෙවන පා සරඹ පදය වේ. (3) නමස්කාර පදය වේ.

03. ද්‍රවිඩ ගැමි නැටුමකි,
(1) කළ ගෙඩි (2) ලී කෙළි (3) සෙම්බු (4) පතුරු

04. නැළවිලි කවි ගායනය කළ යුත්තේ,
(1) ලයාන්විතව ය. (2) සාමුහිකව ය. (3) සම්ප්‍රදායිකව ය. (4) සෙමින් ය.

05. සබරගමු නර්තන සම්ප්‍රදායෙහි ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ........................ වේ.
(1) දවුල (2) ගැටබෙරය (3) තම්මැට්ටම (4) පහතරට බෙරය

06. උඩරට නර්තන සම්ප්‍රදායෙහි ගොඩ සරඹ පහතරට නර්තන සම්ප්‍රදායෙහි දී හඳුන්වන්නේ,
(1) මණ්ඩි පද යනුවෙනි. (2) ඉලංගම් සරඹ යනුවෙනි.
(3) දණ්ඩි සරඹ යනුවෙනි. (4) මාත්‍රා පද යනුවෙනි.

07. "තත්ජිත් තකජිත් තත්ජිත් තොංනං තා" මෙය,
(1) පළමු ගොඩසරඹයේ කස්තිරම ය. (2) පළමු පා සරඹයේ කස්තිරම ය.
(3) දෙවන පා සරඹයේ හමාර පදය ය. (4) දෙවන ගොඩ සරඹයේ කස්තිරම ය.

08. වන්නම් මුලින්ම බිහිවූයේ,
(1) නර්තනය සඳහා ය. (2) ගායනය සහ නර්තනය සඳහා ය.
(3) ගායනය සඳහා ය. (4) ශාන්ති කර්ම සඳහා ය.

09. තෛපොංගල් උත්සවය පවත්වනු ලබන්නේ,
(1) ජනවාරි මාසයේ ය. (2) පෙබරවාරි මාසයේ ය.
(3) අප්‍රේල් මාසයේ ය. (3) දෙසැම්බර් මාසයේ ය.

10. සමූහ චලන නිර්මාණයක සාර්ථකත්වය සඳහා වඩාත් වැදගත් වන්නේ,

(1) එකමුතු බව ය. (2) තාලානුකූල බව ය.

(2) සරල චලන යොදා ගැනීම ය. (4) වෙන් වෙන්ව නර්තනය කිරීම ය.

- **නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| 11. | කෝලම් රටා | (A) උඩරට නර්තන සම්ප්‍රදාය. |
| 12. | කෝලාට්ටම් | (B) දේශීය ගැමි නැටුම්. |
| 13. | පහන්මඩුව | (C) තෛපොංගල් උත්සවය. |
| 14. | කුලු නැටුම | (D) ද්‍රවිඩ ගැමි නැටුම්. |
| 15. | දණ්ඩියමේ සරඹ | (E) සබරගමු නර්තන සම්ප්‍රදාය. |

- **හිස්තැන් පුරවන්න.**

උඩරට සහ පහතරට නර්තන සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ ලෙස පිළිවෙළින් 16. .............................. සහ .............................. හැඳින්විය හැකිය. ඒවායෙහි ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වනුයේ 17. .............................. සහ .............................. ය. ප්‍රධාන ශාන්ති කර්ම ලෙස 18. .............................. සහ .............................. හඳුන්වා දිය හැකි ය. මෙම නර්තන සම්ප්‍රදායන් දෙකට ආවේණික ඇඳුම් කට්ටල වන්නේ 19. .............................. සහ .............................. ය. නර්තන සම්ප්‍රදායන් දෙකෙහි ම මූලික අංගහාරය 20. .............................. නමින් හඳුන්වනු ලැබේ.

( වෙස් ඇඳුම් කට්ටලය , ගැටබෙරය , බදුල්ල , තෙල්මෙ ඇඳුම් කට්ටලය , දෙවොල් බෙරය , මාවර මණ්ඩිය , දොවොල් මඩුව , කොහොඹා කංකාරිය )

(ලකුණු 20)

## II කොටස

★ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

★ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

01. (1) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩයෙහි රූප සටහනක් ඇඳ කොටස් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(2) සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශය, ප්‍රධාන ඇඳුම් කට්ටලය සහ ප්‍රධාන ශාන්ති කර්මය නම් කරන්න. (ලකුණු 03)

(3) අදේශ වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කර ඒවා සෑදීමට ගන්නා අමුද්‍රව්‍ය දෙක බැගින් ලියා දක්වන්න.

(ලකුණු 04)

02. (1) දේශීය ගැමි නැටුම් සහ ද්‍රවිඩ ගැමි නැටුම් අතර ඇති සමානතා දෙකක් සහ අසමානතා දෙකක් ලියන්න.

(ලකුණු 02)

(2) ගැමි නැටුම් නිර්මාණයේදී ප්‍රාසාංගිකබව ඇති වීමට බලපාන සාධක තුනක් ලියන්න.

(ලකුණු 03)

(3) ලී කෙළි කවියක් සහ කළගෙඩි කවියක් ලියන්න. (නම් කිරීම අවශ්‍යයි)

(ලකුණු 05)

03. (1) නර්තන කාමරය තුළදී අනුගමනය කරන චාරිත්‍ර 2ක් ලියන්න. (ලකුණු 02)

(2) ගුරු ගෙදර අධ්‍යාපනය පිළිබඳ වැකි 3ක් ලියන්න. (ලකුණු 03)

(3) නමස්කාරය කිරීමේ අරමුණු ලියා නමස්කාර අභ්‍යාසවල සුවිශේෂී ලක්ෂණ 3ක් ලියා දක්වන්න.(ලකුණු 05)

04. (1) හනුමා වන්නමේ තිත සහ බෙර පදය ලියන්න. (ලකුණු 03)

(2) මෙම වන්නමට අයත් කවි දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) ඔබ දන්නා වෙනත් වන්නම් තුනක් නම් කරන්න (ලකුණු 03)

05. (1) වෙසක් උත්සවය පැවැත්වීමේ හේතු මොනවා ද ? (ලකුණු 03)

(2) වෙසක් උත්සවයේදී එකමුතුකම දක්වන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(3) මෙම උත්සවය හා බැඳි සංස්කෘතික අංග 2ක් සහ සැරසිලි 3ක් නම් කරන්න. (ලකුණු 05)